සියලු ම හිමිකම් ඇවිරිණි (මුලුප් පතිප්පුරිමෙයුණ්ඩතු/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(
General Certificate of Education (Ord. Level) Examination, 2025(

සිංහල සාහිත්‍ය රසාස්වාදය	I, II
இலக்கிய நயம் சிங்களம்	I, II
Appreciation of Sinhala Literary Texts	I, II

සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

* **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද** ඇතුළු ව ප්‍රශ්න තුනකට
* මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්ව

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ	වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො	වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ	වේ
රන් වන් කරල් බරවී දැන් බිමට නැ	වේ
ඔහුගේ ගමට මා ගිය ඒ පළමු	වර
තවමත් සිතේ ඇත අමතක නො වන	යුර
හේනට ගොසින් ගෙන් හූවක් තරම	දුර
එනවා දිවිමි මිටි බැඳ ගෙන වියළි	දර
දරටික තබා සෙවණැති පලු ගසක	යට
පිස දම දමා දාඩිය එන නළල	පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ	කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර	මට
පෙර දැක නොමැති මුත් සුන්දර හාමි	විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු	ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙම්දුල නැඹිලි	ගසින්
පිළිගැන්විය මට සොම්නස පිරුණු	ඇසින්
පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි	වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව	ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය	යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි	ගත්තේ
ආගන්තුකව එන කෙනෙකුට පුරුදු	නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය	සිහි
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය	තුති
සිහිවී මගේ කම්මුල රතු පැහැය	ගති

- මෙම පද්‍ය පන්තියට පාඨක වූ අත්දැකීම
- භාෂා භාවිතයේ විශේෂතා
- යොදා ගත් ආකෘතිය
- අවස්ථා හා සිද්ධි නිරූපණයට කවියා දැක්වූ දක්ෂතාව
- සුන්දර හාමිගේ ජීවන රටාවෙහි විශේෂතා

2. 'තුංමංහංදිය' නවකතාවට පාදක වූ සමාජ පසුබිම නිර්ව්‍යාජ ලෙස නිරූපණයට කතුවරයා දැක්වූ දක්ෂතාව උදාහරණ **තුනක් වත්** ඇසුරෙන් අගයන්න. (ලකුණු 15යි)

3. තාත්ත්වික ලෙස චරිත නිරූපණය සඳහා කතුවරයා දැක්වූ කුසලතාව 'වැලපීම' කෙටිකතාව ඇසුරෙන් උදාහරණ **තුනක් වත්** දෙමින් විමසන්න. (ලකුණු 15යි)

4. ජාති, ආගම් භේදයකින් තොර ව මිනිසුන් මුහුණ දෙන ප්‍රශ්න හා ගැටලු එක හා සමාන බව 'උතුරෙන්' නම් වූ පද්‍ය පන්තිය ඇසුරෙන් නිදර්ශන **තුනක් වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

5. රසවත් කථා වස්තු නිර්මාණයෙහි ලා ධර්මසේන හිමියන්ගේ කුසලතාව 'නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව' පාදක කොට ගෙන නිදසුන් **තුනක් වත්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

* * *